මගේ අංකය.NP/07/10/02/190
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත,
යාපනය.
15.03.2022

අමාත්‍යාංශ ලේකම්වරුන්,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් - පරිපාලය,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
උතුරු පළාත.

**<u>උතුරු පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණවේදී සේවයේ III වන හා IIවන සේවයේ තනතුරු දරණ නිලධරයන් සඳහා 1වන, 2වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය – 2018 (II) 2022</u>**

උතුරු පළාත් ගරු ආණ්ඩුකාරවර විසින් 12.01.2016 වන දින සිට අනුමත කරන ලද හා 01.06.2013දින සිට ක්‍රියාත්මකව පවතින උතුරු පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණවේදී සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 08 වන ඡේදය හා 01, හා 02 වන උපලේඛන ප්‍රකාරව III වන ශ්‍රේණියේ හා IIවන ශ්‍රේණියේ තනතුරු දරණ නිලධරයන් සඳහා වූකාර්යක්ෂමතා කඩඉම් විභාගය ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වර්ෂ 2022දී පැවැත්වීමට නියමිත බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

2.0 **සුදුසුකම් :**

- එක් නිලධරයකුට කාර්යක්ෂමතා කඩඉම් විභාගයන් දෙකටම(ශ්‍රේණීන් දෙකටම)එකවර පෙනී සිටීමට නුසුදුසුවන.
- උක්ත තනතුරේ III වන ශ්‍රේණියේ නිලධරයන් 1වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයට ද IIවන ශ්‍රේණියේ නිලධරයන් 2වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයට ද පෙනී සිටීමට සුදුසුකම් ලබති.
- අදාළ තනතුරේ මේ දක්වා මෙම විභාගයට පෙනී නොසිටි විභාගය සම්පූර්ණ කර නැති නිලධරයන්ද මෙම විභාගය සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබති.

03. මෙම විභාගයට අයදුම් කිරීමේ අයදුම්පත්‍රය මෙම දැන්වීම් අවසානයේ පළ කර ඇත.එම ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලව විභාග අපේක්ෂකයන් විසින් තම අයදුම්පත්‍රය සකස් කර ගත යුතුයි. එසේ සකස් කර ගත් අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් 08.04.2022 වන දිනට හෝ ඊට ප්‍රථම අප කාර්යාලයට ලැබෙන පරිදි "ලේකම්,රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත්, අංක:393/48, කෝවිල් වීදිය, නල්ලූර්, යාපනය."යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුයි. අයදුම්පත් බහා එවන ලියුම් කවරයේ වම් පැත්තේ උඩ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතුයි. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් හා නිසි තොරතුරු සම්පූර්ණ කර නැති අයදුම්පත් ද අහෝසි කරනු ලැබේ.

04. **විභාග අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය** :-විභාග අපේක්ෂකයන් තමා පෙනී සිටින සෑම විෂයයකටම විභාග ශාලාධිපති තෘප්තිමත් වන පරිදි තම අනන්‍යතාවය ඔප්පු කළ යුතු බව ඉල්ලා සිටිනු ලැබේ. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් කුමක් හෝ එකක්විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුයි.

(i) පුද්ගලයින් ලියාපදිංචි කරන දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත
(ii) වලංගු ගුවන් ගමන් බලපත්‍රය (Passport)
(iii) වලංගු රියදුරු බලපත්‍රය (Driving License)

ඉහත දක්වා ඇති ලියකියවිලිවලින් කුමක් හෝ එකක් ඉදිරිපත් කිරීමට අපොහොසත් වූවහොත් විභාගයට පෙනී සිටීමේ හිමිකම අහිමි කිරීමේ බලය අධීක්ෂණ නිලධාරියා සතුය

05. **අයදුම්පත් :-**

- අයදුම්පත්‍රයේ අංක 1 සිට 6 දක්වා වූ ඡේදයන් පළමු පිටුවේ ද 7 සිට 10 දක්වා වූ කොටස් දෙවන පිටුවට ද අන්තර්ගත වන පරිදි A4 ප්‍රමාණයේ කඩදාසියේ පරිගණකය මගින් සකස් කර විභාග අපේක්ෂක තම අත්අකුරු වලින් නිවැරදිව හා පැහැදිලිව සම්පූර්ණ කළ යුතුයි.
- අයදුම්පත මේ සමග ඇති ආදර්ශ අයදුම්පතට සමානව සකස් කර ගත යුතුයි එමෙන්ම එම අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් හෝ පූර්ව නිශ්චිත පිටපත් යනාදි යොමු කිරීමෙන් වැළකිය යුතු බව උපදෙස් දෙනු ලැබේ.
- ආදර්ශ අයදුම්පතට සමාන හා අනුකූල නොවන එමෙන්ම සම්පූර්ණ තොරතුරු සපයා නැති අයදුම්පත් ද කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ඉදිරිපත් කර ඇති විභාග දැන්වීම පරිදි එම අයදුම්පත්වල නිවරද්‍යභාවය සම්බන්ධයෙන් විභාග අපේක්ෂක තම අවධානය යොමු කළ යුතු අතර සම්පූර්ණ කරන ලද අයදුම්පතේ පිටපතක් තමා සතුව තබා ගැනීම ප්‍රයෝජනවත්වනු ඇත.

**06. විභාග ගාස්තු :-**

6.1 පළමු වරට මෙම විභාගයට පෙනී සිටින නිලධරයන් විභාග ගාස්තු කිසිවක් ගෙවීම අවශ්‍ය නොවේ.
6.2 අනෙක් අපේක්ෂකයන් එක් විෂයයකට පමණක් පෙනී සිටින්නේ නම් රුපියල් 250/- ක් හා එක් විෂයයකට වැඩි නම් රුපියන් 500/- ක් ද උතුරු පළාතේ පිහිටි ඕනෑම තැපැල් කන්තෝරුවක ගෙවා මුදල් ඇණවුම, "ලේකම්,රාජ්‍ය සේවා කොමිෂන් සභාව,උතුරු පළාත" යන නමට යාපනය තැපැල් කාර්යාලයෙන් මාරුකර ගතහැකිවන පරිදි ලබා ගත යුතුයි.

6.3අයදුම්කරු මුදල් ඇණවුමේ ඡායා පිටපත ද තම ‍සතුව තමා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය. මෙම ගාස්තුව නැවත ගෙවන්නේ නැති අතර වෙනත් විභාගයන් සඳහා මෙම ගාස්තුව මාරු කිරීම ද කළ නොහැකිය.

07. අයදුම්පත් යොමු කර ඇති විභාග අපේක්ෂකයන්ට,උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කරණු ලැබේ. විභාග අපේක්ෂකයකුට විභාගය සඳහ ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම යනු එම අපේක්ෂකයා විභාගයට පෙනී සිටීම සඳහා සියළුම සුදුසුකම් සම්පූර්ණ කර ඇති බවට සනාථ කිරීමක් නොවන බව සැලකිල්ලට ගත යුතුයි. විභාගයට පෙනී සිටින නිලධරයන් විභාග අධීක්ෂණ නිලධරයාට ඔබගේ අත්සන සහතික කරන ලද ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුයි. එවැනි ප්‍රවේශ පත්‍රයක් නැතිව විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. කිසියම් විභාග අපේක්ෂකයකුට විභාගයට දින 3 කට ප්‍රථම ප්‍රවේශ පත්‍ර ලැබුණේ නැතිනම් පහත සඳහන් තොරතුරු සමඟ උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම වෙත දැන්විය යුතුයි.

- ආවරණ ලිපියක්,
- අයදුම්පත්‍රයේ ඡායා පිටපත,
- විභාග ගාස්තු ගෙවන ලද මුදල් ඇණවුමේ සහතික කරන ලද පිටපත, (මුදල් ගෙවා ඇත්නම් පමණක්)
- අයදුම්පත තැපැල් කළ තැපැල් කාර්යාලය, ලියාපදිංචි අංකය, දිනය.
- ප්‍රවේශපත්‍ර යොමු කළ යුතු ෆැක්ස් අංකය (Fax No),

08. මෙම විභාගයට පෙනී සිටින නිලධරයන්ට, විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ආයතන සංග්‍රහයේ පරිච්ඡේදය XII හි19 වන ඡේදයට අනුකූලව කටයුතු කළ යුතුයි.

09. නිලධරයන් විභාගයෙන් සමත්වීමට පෙනී සිටින එක් එක් විෂයයන් සඳහා සම්පූර්ණ ලකුණු ප්‍රමාණයෙන් අවම වශයෙන් සියයට හතලිහක(40%)ප්‍රතිශතයක් ලබා ගත යුතුයි.

10. විභාගයට පෙනී සිටි සියලුම විභාග අපේක්ෂකයන්ගේම ප්‍රතිඵල උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම විසින් නිකුත් කරනු ලැබේ.

11. **විෂය නිර්දේශය.**

1වන හා 2වන කාර්යක්ෂමතා කඩඉමට අදාළ විෂය නිර්දේශයන් I ලේඛනය හා II වන ලේඛනය මගින් ඉදිරිපත් කර ඇත.

12. මෙම චක්‍රලේඛය මගින් ඉදිරිපත් කර ඇති තොරතුරු ඔබ අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ කාර්යාලයේ සේවය කරන අදාල වන නිලධරයන් වෙත දැනුම් දෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ. තවද මෙම තොරතුරු උතුරු පළාත් අන්තර්ජාලය වන www.np.gov.lk යන ලිපිනයේ Exam & Recruitments ⟶ Advertise ment මගින් ලබාගත හැකිය.

**සැලකිය යුතුයි** :- මෙම චක්‍රලේඛයේ භාෂා මාධ්‍යයන් අතර යම් කිසි අනනුකූලතාවයක් පෙනී යන විටකදී දෙමළ භාෂා මාධ්‍යයේ නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ එමෙන්ම මෙම විභාග දැන්වීම මගින් ප්‍රතිපාදන සලසා නැති කරුණු සම්බන්ධයෙන් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් ගන්නා තීරණය අවසන් තීරණය වනු ඇත.

එස්. තිරුවාකරන්
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
උතුරු පළාත.
15.03.2022

පිටපත :

1. ප්‍රධාන ලේකම් , ප්‍රධාන ලේකම් කාර්යාලය, උතුරු පළාත.

2. නියෝජ්‍ය ප්‍රධාන ලේකම්, ඉංජිනේරු සේවය, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් කාර්යාලය, උතුරු පළාත

## විෂය නිර්දේශය

### ලේඛනය I

1වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය (ශ්‍රේණිය III)

| | | | |
|---|---|---|---|
| 1. ආයතන සංග්‍රහය හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටි රීති. | විෂය අංක (01) | වෙලාව -පැය 02 | ලකුණු 100 |
| 2. මුදල් රෙගුලාසිය | විෂය අංක (02) | වෙලාව -පැය 02 | ලකුණු 100 |

1. ආයතන සංග්‍රහය හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටි රීති..

මෙම ප්‍රශ්න පත්‍රය කොමිෂන් සභාවේ කාර්ය පටිපාටි රීතීන් හා ආයතන සංග්‍රහයෙන් පහත සඳහන් පරිච්ඡේදයන් ආශ්‍රිතයෙන් සකස් කරනු ලැබේ.

**VIII** පරිච්ඡේදය -

**XII** පරිච්ඡේදය -

**XIII** පරිච්ඡේදය -

**XIV** පරිච්ඡේදය -

**XIX** පරිච්ඡේදය -

2. මුදල් රෙගුලාසිය

මෙම ප්‍රශ්න පත්‍රය මුදල් රෙගුලාසියේ පහත සඳහන් පරිච්ඡේද ආශ්‍රිතයෙන් සකස් කරනු ලැබේ.

- **I** පරිච්ඡේදය

  මුදල් රෙගුලාසිය– 1 සිට 68 දක්වා)
- **III** පරිච්ඡේදය

  මුදල් රෙගුලාසිය – 124 සිට 147 දක්වා)

### ලේඛනය II

2 වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය (ශ්‍රේණිය II)

| | | | |
|---|---|---|---|
| 1. ආයතන සංග්‍රහය | විෂය අංක (03) | වෙලාව -පැය 02 | ලකුණු 100 |
| 2. මුදල් රෙගුලාසිය | විෂය අංක (04) | වෙලාව -පැය 02 | ලකුණු 100 |

1. ආයතන සංග්‍රහය

මෙම ප්‍රශ්න පත්‍රය ආයතන සංග්‍රහයේ පහත සඳහන් පරිච්ඡේද ආශ්‍රිතයෙන් සකස් කරනු ලැබේ.

**XV** පරිච්ඡේදය

**XVI** පරිච්ඡේදය

**XXIII** පරිච්ඡේදය

**XXIV** පරිච්ඡේදය

**XXV** පරිච්ඡේදය

**XXVII** පරිච්ඡේදය

**XXVIII** පරිච්ඡේදය

**XXX** පරිච්ඡේදය

**XXXIII** පරිච්ඡේදය

**XLVII** පරිච්ඡේදය

**XLVIII** පරිච්ඡේදය

2. මුදල් රෙගුලාසිය

මෙම ප්‍රශ්න පත්‍රය මුදල් රෙගුලාසියේ පහත සඳහන් පරිච්ඡේද ආශ්‍රිතයෙන් සකස් කරනු ලැබේ.

**VI** පරිච්ඡේදය

- මුදල් රෙගුලාසිය– 315 සිට 396 දක්වා)

**XIII** පරිච්ඡේදය

- මුදල් රෙගුලාසිය 685 සිට – 775 දක්වා